# 3 වන වාර පරීක්ෂණය - 2009

| රෝමානු කතෝලික ධර්මය | කාලය පැය 1 යි |
|---|---|

නම:...................................................................... ශ්‍රේණිය............... අංකය.................

සියලුම ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.

1. පහත සඳහන් වාක්‍යයන් නිවරදි නම් √ ලකුණද වැරදි නම් × ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

| | | |
|---|---|---|
| i. | අභිවෘද්ධි ආලේපය කීපවරක් ලබාගත හැකි සක්‍රමේන්තුවකි. | ( ) |
| ii. | යාච්ඤාව මඟින් දෙවිපියාණන් සමග නිතර සම්බන්ධ විය නොහැක. | ( ) |
| iii. | ප්‍රසාද ස්නාපනය මඟින් අපට ශුද්ධවූ සභාවේ සාමාජිකත්වය හිමිවේ. | ( ) |
| iv. | ඉශ්‍රායෙල් ජනතාව වහල් බවින් බේරාගැනීමට නායකත්වය ගත්තේ මෝසෙස් තුමාය. | ( ) |
| v. | සීනයි ගිවිසුම සිදුවූවේ කල්වාරි කන්දේදීය. | ( ) |

2. පහත දී ඇති උපකාරක පද ඇසුරෙන් ප්‍රහේලිකාව පුරවන්න




**පහළට**

1. අපට දේවදරුකම ලැබෙන්නේ මෙය ලැබීමෙනි.

3.අප අන් අය වෙනුවෙන් සැමවිට කළ යුත්තේ මෙයයි.

6. අපගේ කය මෙන්ම . . . . . . .ද පිරිසිදුව තබා ගත යුතුය.

8. ජීවිතය සුරැකීමය මෙම එනතින් නියම වේ.

9. . . . . . මෙන් තගේ අසල්වැසියාට ප්‍රේම කරව.

**හරහට**

1. දේව වරප්‍රසාදය ඇති තැන මම . . . . . .දරුවෙක් වෙමි.

2. මෙය නිසා අපි දෙවිපියාණන්ගෙන් ඈත් වන්නෙමු..

4. දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව සමඟ සීනයි කඳුමුදුනේදී ඇතිකරගත් ගිවිසුම.

5. අප අන් අයට ආලෝකය දෙන . . . . . . මෙන් විය යුතුයි.

7. අපි උදේ හවස දෙවිදු. . . . . . . . .

(ලකුණු 10)

3. ''අ'' කොටසෙහි ඇති වැකි ''ආ'' කොටස හා ගළපා යා කරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. නව ජීවනයක් අරඹන ප්‍රසාද නිධානයකි | 1. විශ්වාස ලක්ෂණය |
| 2. ක්‍රිස්තුන් වහන්සේ මළවුන් කෙරෙන් උත්ථානය වූයේ | 2. ප්‍රසාද ස්නාපනය |
| 3. අපගේ විශ්වාසයේ සත්‍යතාවයන් අඩංගුයාඥාව | 3. ලූර්දු නුවරය. |
| 4. මරියතුමී බර්ණදෙත් තුමියයට දර්ශනය වූයේ | 4. දස පනතය. |
| 5. සීනයි කන්දේදී මෝසෙස් තුමාට දෙන ලද්දේ | 5. තුන්වනදාය. |

(ලකුණු 2x5 =10)

4. එක් එක් ප්‍රශ්නයට වඩාත් සුදුසු පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

I. ''මම නුඹ මගින් විශාල ජාතියක් ගොඩනගන්නෙමි'' යනුවෙන් දෙවියන් වහන්සේ ප්‍රකාශ කළේ

1. ආබ්‍රම් තුමාටය
2. ජෝසප් තුමාටය
3. ජාකොබ් තුමාටය
4. මෝසෙක් තුමාටය

II. හරි දේ සහ වැරදි දේ තේරුම් ගැනීමට අපව පොළඹ වන්නේ

1. දස පණතයි
2. ප්‍රසාද නිධානයි
3. හෘදසාක්ෂියයි
4. ශුද්ධවූ සභාවේ පණත්

III. දෙව්පියාණන්ට කීකරු වීම ,ගෞරව කිරීම , ආදරය කිරීම හා වන්දනා කිරීම පිළිබඳ අපට නියම වන්නේ,

1. පළමු පණතෙනි
2. හතර වන පණතෙනි
3. හය වන පණතෙනි
4. හත් වන පණතෙනි

IV. පැරණි ගිවිසුමේ සඳහන් අසිරිමත් සිදුවිම වන්නේ .

1. විප්‍රවාසය
2. නොදැවෙන ගිනි පඳුරය
3. දස පණතය
4. නික්මයාමය

V. අටවන පණතට අනුව,

1. සියලුම පොදු දෙපළ ආරක්ෂා කරමි .
2. යාච්ඤා කරමි .
3. සත්‍ය ගරුකව ජීවත් වෙමි.
4. ශරීරය පිරිසිදුව තබා ගනිමි

VI. මහ බ්‍රහස්පතින්දා දින ස්ථාපිත කළ ප්‍රසාද නිධාන වනුයේ,

1. දිව්‍ය සත්ප්‍රසාදය හා අභිවෘද්ධි ආලේපය.
2. රෝගීන්ගේ ආලේපය හා පව් කමාව.
3. පූජකවරයා හා දිව්‍ය සත්ප්‍රසාදය.
4. පූජකවරය හා ආශිර්වාදකාර බන්ධනය

VII. දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට දස පණත දානය කළේ,

1. තාබෝර් කන්දේදීය
2. සීනයි කන්දේදීය
3. කල්වාරි කන්දේදීය
4. හොරෙබ් කන්දේදීය

VIII. මරිය තුමියගේ නිර්දෝෂ පිළිසිඳීමේ මංගල්‍යය සමරන්නේ.

1. දෙසැම්බර් 8 දිනය
2. සැප්තැම්බර් 8 දිනය
3. ඔක්තෝබර් 7 දිනය
4. අගෝස්තු 15 දිනය

IX. ක්‍රිස්තුන් වහන්සේ මරියතුමියගේ කුස තුළ මාංශ ගත වීමේ අභිරහස මුල්කරගෙන නිර්මාණය කර ඇත්තේ.

1. සාන්ත කුරුසිය
2. දයාධික මනස්ථාපය
3. ස්වාමිවාක් ආරාධනාව
4. තුන්කාල ආරාධනාව

X. ඔබ පාසල අයත් වන රදගුරු පදවියේ රදගුරුතුමා වන්නේ

1. අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමස් රදගුරු හිමි
2. අතිඋතුම් මැල්කම් රංජිත් රදගුරු හිමි
3. අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමි
4. අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි රදගුරු හිමි

(ලකුණු 10)

**11 කොටස**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

1) විශේෂ අවස්ථාවලදී භාවිත කිරීමට සුදුසු යාච්ඤා ඇතුලත් කරමින් ඔබ සකස් කළ යැදුම් පොත ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. ඔබ සෑදු යැදුම් පොතේ ඇති යාච්ඤා භාවිත කළ හැකි විශේෂ අවස්ථා 4 ක් ලියන්න.
II. මෙම පොත සකස් කිරීමෙන් ඔබ ලැබූ ප්‍රයෝජන 3 ක් ලියන්න.
III. මෙම නිර්මාණය සඳහා ඔබ තොරතුරු ලබාගත් ආකාර 3 ක් සඳහන් කරන්න.
IV. පන්ති කාමරය තුළ මෙම පොත සකස් කරන අවස්ථාවේදි ඔබ තුළ වර්ධනය කරගත් කිතුනු ගුණාංග 2ක් ලියන්න. (ල 12 යි)

2) මව්කුසින් මෙලොව බිහිවීම මිනිස් ජීවිතයේ උපතයි. එහෙත් කිතුණු ජීවිතයේ උපත වන්නේ ප්‍රසාද ස්නාපනයයි.

I. ප්‍රසාද ස්නාපනය දානය කරනු ලබන්නේ කවුරු විසින්ද ?
II. ප්‍රසාද ස්නාපනයෙන් ලබන දීමනා 4 ක් ලියන්න.
III. ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදි භාවිත කරන ද්‍රව්‍ය 3ක් නම් කර ඒවායින් අදහස් කරන දේ ලියන්න. (ල 12 යි)

3) i. තෙරේසා මව්තුමිය සිය සේවාව දියත් කළ රට හා නගරය ලියන්න.
ii. තෙරේසා මව්තුමිය කළ සේවාවන් 2ක් සඳහන් කරන්න.
එතුමියගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න. (ල 12 යි)

4) "සමිඳුනි ඔබේ කර්මාන්ත කොපමණ විවිධාකාරද ඔබ සියල්ල ප්‍රඥාවෙන් මැවූ සේක."

I. දෙවිපියාණන් විසින් දේව මැවිල්ල කෙරෙහි මිනිසාට පැවරූ වගකීම කුමක්ද?

II. අප ජීවත් වෙන මේ අසිරිමත් ලෝකයේ

අ) මැවුම්කරුවා කවුරුන්ද?

ආ) භාරකරුවා කවුරුන්ද?

අපට පරිසරය ආරක්ෂා කළ හැකි ආකාර 3 ක් ලියන්න. (ල 12 යි)

5) i. ක්‍රිස්තුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 2 ක් ලියන්න.

ii. යාච්ඤාවක ඇතුළත් විය යුතු ප්‍රධාන කොටස් 2 ක් ලියන්න.

ඔබගේ ජීවිතයේ දී දිනපතා කීමට සුදුසු කෙටි යාච්ඤාවක් නිර්මාණය කර ලියන්න. (ල 12 යි)

6) i. පව්කමාව ලබා ගැනීමට ඇති ප්‍රසාද නිධානය නම් කරන්න.

ii. පව්කමාව ලබා දීම පිළිබඳ ක්‍රිස්තුස් වහන්සේ ඉදිරිපත් කළ උපමා කථා 2ක් නම් කරන්න.

iii. දිව්‍ය පූජාවට හා දහම් පාසලට නොයන මිතුරෙකුට ඔබට දිය හැකි අවවාද 3ක් ලියන්න. (ල 12 යි)

7) i. ජනනායක මෝසෙස් තුමාගේ ගත හැකි ආදර්ශයන් 2ක් ලියන්න.

ii. නික්මයාම සිද්ධියේදි ඉශ්‍රයෙල් ජනතාව දේව ආදරය හා රැකවරණය අත්දුටු අවස්ථා 2 ක් ලියන්න.

iii. යහපත් නායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 3 ක් ලියන්න. (ල 12 යි)

8) මේවායින් මාතෘකා 2 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. මෝසෙස් තුමා

ii. ප්‍රේමයේ පණත

iii. කුරුසියේ යාගය

iv. ජපමාලය

(ලකුණු 2 × 6 =12)